# රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

**වාණිජ මුද්‍රණ, ආරක්ෂිත මුද්‍රණ, ප්‍රකාශන සහ ලිපිද්‍රව්‍ය නිෂ්පාදන කටයුතුවල නියැලි මනා ලෙස ස්ථාපිත ලාභ උපදවන වාණිජ ආයතනයක් වන රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, පහත සඳහන් ඇබෑර්තුව සඳහා ජයග්‍රාහී අතීත වාර්තා සහිත උද්‍යෝගී හා ප්‍රතිඵල දිශාභිමුඛ ශ්‍රී ලාංකිකයකු බඳවා ගැනීමට බලාපොරොත්තු වේ.**

## කළමනාකරු (අලෙවිකරණ) තනතුර

**ඵලදායී වෘත්තියකි**

අලෙවි දෙපාර්තමේන්තුවේ සියලුම කළමනාකරණ කටයුතු හා අලෙවි කුට්ටවල ක්‍රියාකාරකම්හි සමස්ත අධීක්ෂණය පිළිබඳව කාර්යභාරව සිටීම, සංස්ථාවේ නිෂ්පාදනවල අලෙවිය වැඩිදියුණු කිරීමට ඵලදායී හා කාර්යක්ෂම අලෙවිකරණ උපායමාර්ග ක්‍රියාත්මක කරලීම.

**සුදුසුකම් :**

**අධ්‍යාපනික (බාහිර)**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ප්‍රථම උපාධියක් (අලෙවිකරණය හෝ ව්‍යාපාර පරිපාලනය පිළිබඳව නම් මැනවි) සහ පශ්චාත් උපාධියක් (මාස්ටර්ස්) හෝ පිළිගත් වෘත්තීය ආයතනයක වරලත් සාමාජිකත්වය සමග රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) පළපුරුද්ද.

**(අභ්‍යන්තර)**

අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ ප්‍රභේදයේ i වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අය මෙම තනතුර සඳහා සුදුස්සෝ වෙති.

**වෙනත් අවශ්‍යතාවයන් :**

- අලෙවි කිරීමේ හා සාකච්ඡා කිරීමේ මනා දැනුම.
- ප්‍රබල නායකත්ව ගුණාංග
- විශිෂ්ට සංනිවේදන නිපුණතා
- මැනැවින් සංවිධිත
- බලගතු කාර්යය සාරධර්ම
- උසස් අන්තර්පුද්ගල නිපුණතා
- විස්තර කිරීමට සූක්ෂම අවධානය
- පරිගණක සාක්ෂරතාව
- පූර්ව ක්‍රියාකාරී ස්වභාවය
- අලෙවි ඉලක්ක / අරමුණු සපුරාගැනීමේ හැකියාවැති සාමූහික කණ්ඩායම් සාමාජිකයකු, ගැටළු නිරාකරණය කරන්නකු සහ ස්වයංගාමක පුද්ගලයකු වීම.
- ඕනෑම අවස්ථාවක දිවයින පුරා සංචාරය කිරීමේ තත්ත්වයක සිටිය යුතුය.
- කොළඹ සහ තදාසන්න ප්‍රදේශයන්හි පදිංචි අයදුම්කරුවන් විශේෂයෙන් සළකා බැලේ.

**වැටුප් පරිමාණය :**

HM 1-1 - රු. 80,295/- 15X2,270 - 114, 345/- (මාසිකව)

**වයස් සීමාව :**

වයස අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

**වෙනත් වරප්‍රසාද :**

නිල සංචිත ප්‍රවාහන පහසුකම් හෝ චක්‍රලේඛ අංක PED 1/2015 (ii) පරිදි තමාගේම වාහනයට දීමනාවක් සහ ඉන්ධන.

**බඳවා ගැනීමේ පිළිවෙළ :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකිනි.

**සේවා කොන්දේසි :**

ඉහත තනතුර ස්ථිර වන අතර, වසර 03 ක පරිවාස කාලයකට යටත් වේ. අභ්‍යන්තරිකව තෝරාගත්, පෙර තනතුරෙහි දැනටමත් ස්ථිර කර ඇති සේවකයින් එක් (01) වසරක වැඩබලන කාලයකට යටත් වේ.

වැටුපට අමතරව පහත සඳහන් දීමනාවන්ටද හිමිකම් ලබයි.

- රජයේ අනුමත දීමනා
- වාර්ෂික ප්‍රසාද දීමනා
- සේ.අ.අ. සහ සේ.භා.අ.
- ලබා නොගත් නිවාඩු සඳහා මුදල් ලබා දීම.

**අයදුම් කළ යුතු අන්දම :**

සම්පූර්ණ ජීවදත්ත, ලිපිනය හා දුරකථන අංක ඇතුළත් අයදුම්පත් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සහතික පිටපත් සහ ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ දුරකථන අංක සමග 2024-06-04 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන්නට සැලැස්විය යුතුය.

රජයේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය අංශ ආයතනයන් හි සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

අයදුම් කරන තනතුර ලිපි කවරයේ වම් ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.

**සභාපති,**
**රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව,**
**පානලුව, පාදුක්ක.**